# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (1)

## ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (08)

කාලය පැය 03 යි.

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01 i රජයක් එරට ආර්ථිකයට මැදිහත් වීමෙන් (Intervention) බලාපොරොත්තු වන ප්‍රධාන අරමුණු පැහැදිලි කරන්න.

ii රටක සමාජ ආර්ථික සංවර්ධනය සඳහා මැදිහත් වීමට රජයක් විසින් යොදා ගන්නා ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මොනවාද?

iii රජය භාණ්ඩ හා සේවා සඳහා කරනු ලබන වියදම ඉහළ දැමූවා යයි උපකල්පනය කරන්න. අනිකුත් සියළු සාධක වෙනස් නොවේ නම් එමගින් සමතුලිත ජාතික ආදායමට හා වෙළඳපොල පොලී අනුපාතයන්ට සිදුවිය හැකි බලපෑම සාකච්ඡා කරන්න.

02 i රටක ආර්ථික වර්ධනය (Economic Growth) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

ii ආර්ථික වර්ධනය (Economic growth) ආර්ථික සංවර්ධනයෙන් (Economic development) වෙන් කර දක්වන්නේ කෙසේද?

iii ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන නිර්නායක මොනවාද?

iv "ශ්‍රී ලංකාව රටවල් 40 ක මානව සංවර්ධන තත්වයන් ඉක්මවා යන ඉහළ මානව සංවර්ධන තත්ව කණ්ඩායමට ඇතුළත් වී ඇත". – (2013 මාර්තු 3 වන දින නිකුත් කරන ලද එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වාර්තාව.) සාකච්ඡා කරන්න.

03 i ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දිගුකාලීන සාමය පවත්වා ගෙන යාමේ වැදගත්කම පැහැදිලි කරන්න.

ii දිගුකාලීන සාමයක් රට තුළ පවත්වා ගෙන යාමේදී, ශ්‍රී ලංකාව මුහුණ පෑ හැකි අභියෝගයන් මොනවාද?

iii එවැනි අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට යොදාගත හැකි වඩාත් ඵලදායි උපායමාර්ග මොනවාද?

iv ශ්‍රී ලංකාවේ සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය සඳහා උපාය මාර්ගික ජාත්‍යන්තර සහයෝගිතාවයන් ඇති කිරීමේ වැදගත්කම ඔබ අවබෝධ කරගන්නේ කෙසේද?

i. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ සමාජ සුභසාධන ප්‍රතිපත්ති (social welfare policies) කෙටියෙන් විස්තර කරන්න.

ii ශ්‍රී ලංකාවේ ඉහල සමාජ ආර්ථික තත්ත්වයක් ඇති වීම සඳහා ඉහත ප්‍රතිපත්ති කෙතෙක්දුරට බලපෑවේද?

iii ශ්‍රී ලංකාව වැනි කුඩා ආර්ථිකයකට මෙවැනි සමාජ සුභසාධන ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යාමෙන් සිදුවන ආර්ථික ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න.

05 i මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි මූලිකව සඳහන් කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ වර්තමාන සංවර්ධන අභිලාෂය "ආසියාවේ නැගී එන ආශ්චර්යය" බවට පත්වීමයි. මෙයින් අදහස් කරන්නේ කුමක්ද?

ii එනයින් වූ අපේක්ෂිත ඉලක්ක ඉටු කර ගැනීම සඳහා වර්තමාන ආර්ථික ප්‍රතිපත්ති කොතෙක්දුරට ඉවහල් වේද?

iii මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි අපේක්ෂිත ඉලක්ක ඉටු කර ගැනීමේදී ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවිය හැකි ප්‍රධාන අභියෝග මොනවාද?

06 i දිළිදුකමේ බහුමානීය ස්වභාවය (Multi –dimensional nature of poverty) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

ii ශ්‍රී ලංකාවේ වර්තමාන දුගී භාවයේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කර එහි ප්‍රධාන ප්‍රවණතා හඳුනාගන්න.

iii ශ්‍රී ලංකාවේ දිළිදුකමේ බහුමානීය ස්වභාවය (Multi –dimensional nature of poverty) කොතෙක්දුරට දිවිනැගුම ජාතික වැඩසටහන මගින් ආමන්ත්‍රණය කර ඇත්දැයි විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

07 "ලෝකයේ කුරිරුම ත්‍රස්තවාදි සංවිධානය විනාශ කළ ඉතා කුඩා රටක් වන ශ්‍රී ලංකාව අත්කරගත් මේ ජයග්‍රහණය බටහිර ලෝකය මගින් නිසි සැළකිල්ලට භාජනය කර නොමැත. මෙම තත්වය තුළ ලංකාවට එහි සමාජ ආර්ථික වර්ධනය ළඟා කර ගැනීමේදී නොයෙකුත් අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ." ඔබ මේ ප්‍රකාශයට එකඟ වන්නේද? විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

***************